**ගොවිජන සංවර්ධන අරමුදල - 2020**

**--------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**---------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය.

**------------------------------**

ගොවිජන සංවර්ධන අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍යතත්ත්ව ප්‍රකාශනයසහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනයසහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේමූල්‍යප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම.

**----------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝවෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේවගකීම සම්බන්ධ පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීනමූල්‍ය ප්‍රකාශනපිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4. මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම.

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර,එහි ප්‍රමාණාත්මක භාවයමෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදීවෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ල දවිගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රමිත අංක 3 හි 47 ඡේදය ප්‍රකාරව ප්‍රමාණාත්මක පූර්ව කාලපරිච්ඡේදවල වැරදි ඒවා සොයා ගැනීමෙන් පසුව නිකුත් කරන මූල්‍ය ප්‍රකාශනවල අතීතානුයෝගීව ගලපා සන්සන්දනාත්මක අගයන් ප්‍රතිෂ්ඨාපනය කර එම වැරදිවල ස්වභාවය හා ගලපන ලද ආකාරය පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වුවද, ඉකුත් වර්ෂයට අදාළව සමාලෝචිත වර්ෂයේදී රු. 17,178,685 ක මූල්‍ය ප්‍රකාශනවල වැරදි නිවැරදි කිරීම් කර නැවත ප්‍රතිෂ්ඨාපනය කර තිබුණද ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් කර නොතිබුණි. | 2020 ලෙජර් ගිණුමේ පොදු ජ'නලය මගින් හෙළිදරව් කර ඇත. එම සටහන් සංවර්ධන අරමුදලෙහි මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි සටහන් තුළ සඳහන් නොවීම ඉදිරියේදී වළක්වා ගැනීමට කටයුතු කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසර පත්‍ර ආදායමෙන් අරමුදලට බැරවිය යුතු සියයට 40 ක ප්‍රමාණය රු. 5,306,044 ක් වුවත්, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ අවසර පත්‍ර ආදායම වශයෙන් රු. 2,533,691 ක් පමණක් දක්වා තිබුණි. ඒ අනුව ආදායම රු. 2,772,353 ක් අඩුවෙන් හා ලැබිය යුතු අවසර පත්‍ර ආදායම් ගිණුම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී ඊට අදාළ ගැළපීම් සිදු කිරීමට කටයුතු කරමි. | අරමුදලට අදාළ අවසරපත්‍ර ආදායම නිසි පරිදි හඳුනාගත යුතුය. |
| (ආ) | ගොවිජන සේවා මධ්‍යස්ථානවලින් 2017 වර්ෂයේ නොවැම්බර් දක්වා අයකර ගත් අවසර පත්‍ර ගාස්තුවලින් ගොවිජන සංවර්ධන අරමුදලට ලැබිය | තොරතුරු ලද වහාම ගිණුම් ප්‍රකාශන වල ගැළපීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | අරමුදලට අදාළ අවසරපත්‍ර ආදායම නිසි පරිදි හඳුනාගත |

| | | | |
|---|---|---|---|
| | යුතු සියයට 40 ක වටිනාකම හඳුනාගෙන ගිණුම් තබා නොතිබුණි. ඒ හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට ගොවිජන සේවා මධ්‍යස්ථාන 56 කින් ලැබිය යුතු රු. 11,553,621 ක් ගිණුම්ගත කර නොතිබුණි. | | යුතුය. |
| (ඇ) | ඉකුත් වර්ෂවලට අදාළව ලැබුණු "ගොවිමිණ" සඟරා අලෙවි ආදායම වූ රු. 22,800 ක් හිමිකම් නොපෑ ඉඩම් ප්‍රවේණි ගාස්තුව වූ රු. 301,943 ක් ගොවීන්ගෙන් අය කළ රෝද 02 ට්‍රැක්ටර් ණය වාරික මුදල වූ රු. 7,641,488 ක් හා ගොවිජන සේවා මධ්‍යස්ථාන වලින් අය කළ රෝද 04 ට්‍රැක්ටර් ණය වාරික මුදල් රු. 50,000 ක් වශයෙන් එකතුව රු. 8,016,231 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි වර්ෂවලදී නිවැරදි ලෙස ගිණුම් ගත කිරීමට කටයුතු කරමි. | එක් එක් වර්ෂයන්ට අදාළ ආදායම නිසි පරිදි හඳුනාගත යුතුය. |
| (ඈ) | 2019 දෙසැම්බර් 31 දිනට රෝද 02 ට්‍රැක්ටර් ණයගැතියෝ රු. 2,551,196 ක් අඩුවෙන් දක්වා තිබුණු අතර එම කරුණ සමාලෝචිත වර්ෂයේදීද, නිවැරදි නොකිරීම හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට රෝද 02 ට්‍රැක්ටර් ණයගැතියෝ සහ උපලබ්ධි නොවූ රෝද 02 ට්‍රැක්ටර් වාරික තැන්පත් ගිණුම එම ප්‍රමාණයෙන්ම අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි තොරතුරු ලද වහාම ගිණුම් ප්‍රකාශන වල ගැලපීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කළ යුතුය. |
| (ඉ) | 2020 දෙසැම්බර් 31 දිනට රෝද 04 ට්‍රැක්ටර් හිඟ ණයගැති ශේෂය රු. 19,632,600 ක් විය යුතු වුවත්, මූල්‍ය ප්‍රකාශනවල එය රු. 11,305,000 ක් ලෙස දැක්වීම හේතුවෙන් ණයගැති ශේෂය සහ උපලබ්ධි නොවූ රෝද 04 ට්‍රැක්ටර් වාරික තැන්පත් ගිණුමේ ශේෂය රු. 8,327,600 ක් අඩුවෙන් දක්වා තිබුණි. | අදාළ නිවැරදිම ශේෂයන් ලබා ගැනීම සඳහා සම්පූර්ණ පරීක්ෂණයක් මේ වන විට සිදු කරමින් පවතී. | අයවිය යුතු ශේෂ නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | 2019 වර්ෂයට අදාළව ලැබුණු සියයට 20 ක අක්කර බදු දායකය වූ රු. 188,785 ක මුදල වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල අක්කර බදු ආදායම හා ලැබිය යුතු අක්කර බදු ආදායම වැඩියෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | එක් එක් වර්ෂයන්ට අදාළ ආදායම නිසි පරිදි හඳුනාගත යුතුය. |

**1.5.3 පැහැදිලි නොකළ වෙනස්කම්.**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට අරමුදලේ පොත් අනුව තැන්පත් ගිණුම් ශේෂය රු. 259,321,334 ක් වුවද භාණ්ඩාගාර පොත් අනුව තැන්පත් ගිණුම් ශේෂය රු. 259,973,482 ක් විය. ඒ අනුව රු. 652,148 ක වෙනස හඳුනාගෙන නිරවුල් කර නොතිබුණි. | රු. 651,797ක වෙනස පිළිබඳව පරීක්ෂා කර බැලීම සඳහා පත් කර ඇති කමිටුව විසින් එම වෙනස්කම් පවතින කාලපරිච්ඡේදයන්හි අරමුදලට අදාළව සිදු වූ ගනුදෙනු එකින් එක අධ්‍යයනය කර වෙනසට බලපෑ ගණුදෙනු හඳුනාගෙන නිවැරදි කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම සුදුසු බව යෝජනා කර තිබුණි. | වෙනස හඳුනාගෙන නිරවුල් කළ යුතුය. |
| (ආ) | 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ රෝද 02 ට්‍රැක්ටර් ණයගැතියෝ ලෙස රු. 124,864,467 ක් ලෙස දක්වා ඇති නමුත් සේවා අංශය විසින් ලබාදුන් වාර්තාවේ එම වටිනාකම රු. 124,088,017 ක් විය. ඒ අනුව රු. 776,450 ක නොසැසඳූ වෙනසක් නිරීක්ෂණය විය. | කොමසාරිස් (සේවා) විසින් නිවැරදි වාර්තාවක් ලබාදුන් පසු එම වාර්තාවන් අධ්‍යයනය කොට 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | මූල්‍ය ප්‍රකාශනවල ශේෂ අදාළ අංශවල උපලේඛන සමඟ සැසඳිය යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්.**

**1.6.1 ලැබිය යුතු මුදල්.**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දින වන විට රෝද 04 ට්‍රැක්ටර් ණය රු. 19,632,600 ක් හිඟව තිබුණු අතර එම මුදල් අදාළ ගොවිජන සේවා මධ්‍යස්ථාන වලින් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කඩිනමින් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට බලාපොරොත්තු වන බව කාරුණිකව දන්වා සිටිමි. | අයවිය යුතු ණය ශේෂ අයකර ගත යුතුය. |

**1.6.2 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.**

| | නීතිරීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | **2011 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතින් සංශෝධිත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන** | යම් වර්ෂයක අක්කර බදු අය කිරීමේ කටයුතු එම වර්ෂයේම මාර්තු 31 දිනට ප්‍රථම සිදු කළ යුතු වුවත් එම කාර්යය | 2020 වර්ෂයේ අක්කර බදු අය කිරීම වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා 2020 පෙබරවාරි 24 දින සිට 2020 මාර්තු 01 දක්වා සතිය අක්කර බදු සතිය ලෙස වැඩසටහනක් ක්‍රියාත්මක කළ නමුත් | පනතේ විධිවිධාන ප්‍රකාරව අක්කර බදු අය කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | **පනතේ 56(1) උප වගන්තිය** | ඉකුත් වර්ෂවලදී හා සමාලෝචිත වර්ෂයේදී එසේ සිදු කර නොතිබුණි. 2020 දෙසැම්බර් 31 දිනට ගොවිජන සේවා මධ්‍යස්ථාන අයකර ගත යුතු රු. 20,990,383 ක අක්කර බදු මුදලක් තිබුණි. | රට තුළ පැවති කොවිඩ්-19 තත්ත්වය හමුවේ අක්කර බදු එකතු කිරීමේ කටයුතු වලට බාධා සිදු වූ අතර හිඟ මුදල් කඩිනමින් අය කර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | |
| (ආ) | 2015 ජූලි 14 දිනැති 3/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371 (5) | අත්තිකාරම් පියවීම නිකුත් කරන ලද මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැඩියෙන් ප්‍රමාද නොකළ යුතු වුවත් දිස්ත්‍රික් කාර්යාලවලට ඉදි කිරීම් සහ මිලදී ගැනීම් සඳහා ඉකුත් වර්ෂයේ ලබාදුන් රු. 6,610,000 ක අත්තිකාරම් ශේෂයක් විගණිත දිනය වූ 2021 මාර්තු 08 දින වන විටත් පියවීමට කටයුතු කර නොතිබුණි. | දිස්ත්‍රික් කාර්යාල වෙත ඉදිකිරීම් සහ මිලදී ගැනීම් සඳහා ඉකුත් වර්ෂයේ ලබාදුන් අත්තිකාරම් පියවන ලෙස අදාල නියෝජ්‍ය/සහකාර කොමසාරිස් වරුන් වෙත කිහිප වතාවක්ම දන්වා යවා ඇති අතර එම අත්තිකාරම් පියවීමට අදාලව ඇතැම් වවුචර්පත් ගිණුම් අංශය වෙත ඉදිරිපත් කර තිබුණද එම වවුචර්පත්වල පැවති අඩුපාඩු හේතුවෙන් නැවතත් අදාල දිස්ත්‍රික් කාර්යාල වෙත හරවා යවන ලද අතර 2021 වර්ෂය තුළ එම අත්තිකාරම් පියවීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වා සිටිමි. | තත්කාර්ය අතුරු අග්‍රිම ප්‍රමාදයකින් තොරව පියවා ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| (ආ) | 2015 ජූලි 14 දිනැති 3/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මු.රෙ 371 (5) | ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිම අදාළ කාර්යය අවසන් කර දින 10 ක් ඇතුළත නිරවුල් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ ලබා දුන් රු. 16,711,653 ක අත්තිකාරම් ශේෂයක් 2021 මාර්තු 08 දින දක්වා පියවීමට කටයුතු කර නොතිබුණි. | 2020 වර්ෂයේ කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් මාස 03 ක පමණ කාලයක් රට වසා තැබීම නිසා යෝජනාවලි සකස් කිරීම සහ ඇස්තමේන්තු ගෙන්වා ගැනීම ප්‍රමාද වූ බැවින් ඉදිකිරීම් කටයුතු සඳහා සමාලෝචිත වර්ෂයේ ලබාදුන් අත්තිකාරම් වලින් අත්තිකාරම් කිහිපයක්ම දිස්ත්‍රික්ක වෙත 2020 වර්ෂයේ අවසන් මාස 03 ඇතුළත යවා ඇති අතර එම කර්මාන්ත මෙතෙක් වැඩ අවසන් කර නොමැත. එමෙන්ම කොවිඩ් -19 තත්ත්වය මත රජය විසින් නීති හා රෙගුලාසි වලට අනුව නිලධාරීන් රැස් කිරීමේ කටයුතු හා නිලධාරීන්ගේ පැමිණීම සීමා කර තිබූ බැවින් පුහුණු වැඩසටහන් වලට අදාලව ලබාදුන් බැවින් අත්තිකාරම් පියවීමේ කටයුතු ද ප්‍රමාද වී ඇත. | තත්කාර්ය අතුරු අග්‍රිම ප්‍රමාදයකින් තොරව පියවා ගැනීමට ක්‍රියා කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල.

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 22,035,319 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ එය රු. 3,793,421 ක ඌනතාවයක් විය. ඒ අනුව මෙහෙයුම් ප්‍රතිඵලයෙහි රු. 25,828,740 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සැපයුම් වැඩිදියුණු කිරීමේ හා සංවර්ධනය කිරීමේ වියදම් රු. 10,102,210 කින් අඩුවීම, නිලධාරීන් පුහුණු කිරීමේ වියදම් රු. 15,057,824 කින් අඩුවීම, ගොඩනැගිලි වාහන සහ උපකරණ නඩත්තු හා අලුත්වැඩියා වියදම් රු. 4,429,141 කින් අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

ඉකුත් වර්ෂය සමඟ සමාලෝචිත වර්ෂය සැසඳීමේදී සියයට 20 අක්කර බදු ආදායම සියයට 7 කින් වැඩි වී තිබුණු අතර ජල ධාරා අත්පොත්, සිතියම් හා වගා කන්න අත්පොත් අලෙවි ආදායම, අවසරපත්‍ර ගාස්තු හා ගොඩකිරීම් ආදායම, වෙනත් ලැබීම්, රෝද 02 ට්‍රැක්ටර් ආදායම හා කුවිතාන්සි පොත් අලෙවි ආදායම පිළිවෙළින් සියයට 99, 62, 54, 44 හා 35 කින් අඩු වී තිබුණි. එසේම සැපයුම් වැඩිදියුණු කිරීම හා සංවර්ධනය කිරීමේ වියදම, පොදු වියදම්, ගොඩනැගිලි, වාහන සහ උපකරණ නඩත්තු හා අලුත්වැඩියා වියදම් හා නිලධාරීන් පුහුණු කිරීමේ වියදම් පිළිවෙළින් සියයට 100, 83, 69 හා 56 කින් අඩු වී තිබුණු අතර ගොවිජන කේන්ද්‍ර පරිපාලන හා සංවර්ධන වියදම් හා ස්ථාවර වත්කම් ක්ෂය පිළිවෙළින් සියයට 11563 හා 47 කින් වැඩි වී තිබුණි.

### 2.3 අනුපාත විශ්ලේෂණය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආදායම් අතිරික්ත අනුපාතය සියයට 44 කින් වැඩි වී ඇති අතර ජංගම අනුපාතය හා ක්ෂණික වත්කම් අනුපාතය පිළිවෙළින් සියයට 0.16 කින් හා සියයට 0.15 කින් වැඩි වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවස්ථා 03 කදී දිස්ත්‍රික් සහකාර කොමසාරිස්වරුන් විසින් පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා ලබාගත් රු. 1,248,280 ක අත්තිකාරම් මුදලක් අදාළ කාර්යය සඳහා යොදා ගැනීමකින් තොරව දින 106 කට පසු නැවත අරමුදල වෙත ආපසු බැඳ තිබුණි. | පැවති කොරෝනා වසංගත තත්ත්වය මත රජය විසින් නීති හා රෙගුලාසි වලට අනුව නිලධාරීන් රැස් කිරීමේ කටයුතු හා නිලධාරීන්ගේ පැමිණීම සීමා කර තිබූ බැවින් මහනුවර, ගාල්ල හා මාතර යන දිස්ත්‍රික් කාර්යාල මගින් පුහුණු වැඩසටහන් පවත්වා නොතිබීම හේතුවෙන් අත්තිකාරම් ලබා ගත්තද පුහුණු වැඩසටහන් නොපැවැත්වීම නිසා ලබාගත් අත්තිකාරම් ආපසු බැඳීම සිදුකර තිබුණි. | තත්කාර්ය අතුරු අග්‍රිම ප්‍රමාදයකින් තොරව පියවා ගැනීමට ක්‍රියා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කුඹුරු ඉඩමක් නොවන බවට සහතික ලබාදීම හා කුඹුරු ඉඩමක් වෙනත් කාර්යයක් සඳහා යෙදවීමට සහතික ලබාදීම සඳහා අයදුම්කරුවන් 02 කගෙන් 2018 හා 2019 වර්ෂවලදී රු. 1,075,200 ක් ලබාගෙන තිබුණද 2021 මාර්තු 24 දින වන විටත් අයදුම්කරුවන් වෙත අවසරපත්‍ර නිකුත් කර නොතිබුණි | 7/11/9/CO/2650 ගොනුවට අදාලව 2018 පෙබරවාරි 12 දිනැතිව රු. 912,000 ක මුදලක් සේවා ගාස්තු ලෙස අයකර ඇති අතර, ගොනුවේ නිර්දේශ වසර 08 කට වඩා පැරණි බැවින් හා 7/11/3/CO/1058 ගොනුවට අදාළව 2018 පෙබරවාරි 16 දිනැතිව රු.163,200 ක මුදලක් සේවා ගාස්තු ලෙස අයකර ඇති නමුත්, ගොනුවේ නිර්දේශ වසර 03 කට වඩා පැරණි බැවින්ද බලපත්‍ර නිකුත් කල යුතු දිනය වන විට බස්නාහිර පළාතේ කුඹුරු ඉඩම් වෙනත් කාර්යයක් සඳහා යෙදවීමට අවසර ලබා දීම අත්හිටුවා ඇති බැවින්ද අදාල බලපත්‍ර නිකුත් කර නොමැත. | මුදල් ලබාගෙන තිබුණු කාර්යයන් වෙනුවෙන් ප්‍රමාදයකින් තොරව බලපත්‍ර ලබාදිය යුතුය. එසේ නොමැති නම් මුදල් ආපසු ගෙවිය යුතුය. |
| (ඇ) | 2006 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා ණය පදනම මත බෙදා දුන් රෝද 02 ට්‍රැක්ටර්වලින් වාරික ගෙවා අවසන්ව තිබුණු ට්‍රැක්ටර් 705 ක් 2020 දෙසැම්බර් 31 දින දක්වා ගොවීන් වෙත පවරා දී නොතිබුණි. | කඩිනමින් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට බලාපොරොත්තු වන බව කාරුණිකව දන්වා සිටිමි. | ණය වාරික ගෙවූ ගොවීන්ට වත්කම් පවරා දිය යුතුය. |
| (ඈ) | 2020 දෙසැම්බර් 31 දින මූල්‍ය ප්‍රකාශන තුළ පෙර වර්ෂවල සිට පැවත එන රු. 450,000 ක තොග ඌනතාවය සම්බන්ධයෙන් පත්කරන ලද කමිටුව විසින් ඒ සම්බන්ධයෙන් තීරණයක් ලබා නොදීම හේතුවෙන් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මේ පිළිබඳව පරීක්ෂා කර බැලීම සඳහා පත් කර ඇති කමිටුව විසින්, මීට සම්බන්ධ පාර්ශවයන්ගෙන් පරීක්ෂණයක් පැවැත්වීමට සුදුසු බව නිර්දේශ කර ඇත. මේ පිළිබඳව විනය අංශය ද දැනුවත් කොට ඒ අනුව ඉදිරියේදී නිසි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි පරීක්ෂණ කඩිනමින් සිදුකර අලාභ අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන අභිමන් වැඩසටහනක් පැවැත්වීම අරමුදලේ කාර්යයක් නොවුවද 2019 වර්ෂයේ ගොවිජන අභිමන් වැඩසටහනේ බිල්පත් පියවීම සඳහා 2020 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ රු. 200,000,000 ක් වෙන් | 2018 වර්ෂයේදී හඳුනාගෙන ක්‍රියාත්මක කරන ලද මෙම ගොවිජන අභිමන් වැඩසටහන ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය හා එකඟතාවය මත පවත්වන ලදී.<br><br>2020 වර්ෂයේදී පවත්වනු ලැබූ මහ මැතිවරණය | පනතේ අරමුණු සඳහා පමණක් වියදම් දැරිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කර තිබුණු අතර ඉන් රු. 650,000 ක් ඒ සඳහා වැයකර තිබුණි. | හා දිවයිනෙහි පැවති අයහපත් කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් අදාළ වැඩසටහන ඉදිරියට පවත්වා ගෙන නොයන ලදී.<br>2020 වර්ෂයෙහි වෙන් කරන ලද රු.මි.20 ක මුදලින් 2019 වර්ෂයේ "ගොවිජන අබිමන්-2018" වෙනුවෙන් දරන ලද වියදම් වෙනුවෙන් ලබාදුන් අත්තිකාරම් පියවීම සඳහා භාවිතා කර ඇත. | |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ හා පසුගිය වර්ෂවලදී අරමුදලේ කර්තව්‍ය හා කාර්යයක් වූ කෘෂිකාර්මික පර්යේෂණ කටයුතු කිසිවක් සිදුකර නොතිබුණි. | කෘෂිකාර්මික පර්යේෂණ කටයුතු සඳහා මානව සම්පත අප සතුව නොමැති බැවින් ඉදිරි වර්ෂ වලදී ඒ සම්බන්ධයෙන් කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වෙමි. | පනතේ කර්තව්‍ය හා කාර්යයන් ඉටු කර ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| (ඇ) | ගොවි බැංකු සඳහා කාර්යාල උපකරණ, ආරක්ෂිත සේප්පු සහ මෘදුකාංග පද්ධතියක් ලබා ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම මගින් රු. මිලියන 6 ක් වෙන් කර තිබුණද 2020 වර්ෂයේ එම කාර්යයන් සිදු කර නොතිබුණි. | 2020 වර්ෂයේ පැවති කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් රාජකාරි කටයුතු වල සිදු වූ ප්‍රමාණාත්මක අඩුවීමත් නිලධාරීන් හට චක්‍රීය ලෙස රාජකාරි කටයුතු කිරීමට සිදුවීමත්, හදිසි හා වඩාත් අත්‍යාවශ්‍ය රාජකාරි සඳහා එම කාලය තුළ ප්‍රමුඛතාවය ලබාදීමට සිදුවීමත් හේතුවෙන් අදාළ කාර්යය සිදු කිරීමට නොහැකි විය. | ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව සැලසුම් කළ කාර්යයන් නිසි පරිදි ක්‍රියාත්මක කළ යුතුය. |

**4.2** **අයවැය පාලනය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ අරමුදලේ නව කෘෂිකාර්මික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, සැපයුම් වැඩිදියුණු කිරීම හා සංවර්ධනය කිරීම, ගොවිජන සේවා මධ්‍යස්ථානවල භෞතික සම්පත් සංවර්ධනය කිරීම සහ හඳුනාගත් පුරන් කුඹුරු වගාවට යොමු කිරීම සඳහා අයවැය මගින් මුදල් ඇස්තමේන්තු කර තිබුණද එම කාර්යයන් සිදුකර නොතිබුණි. | කොවිඩ්-19 වසංගතත ත්ත්වය හේතුවෙන් රට තුළ පැවති අස්ථාවරත්වය මත හදිසි හා වඩාත් අත්‍යාවශ්‍ය රාජකාරි සඳහා ප්‍රමුඛතාවය ලබා දීමට සිදුවීම හේතුවෙන් එම කාර්යයන් සහ සංවර්ධන අරමුදලින් ඇස්තමේන්තුගත බොහොමයක් කාර්යයන් නියමිත පරිදි සිදු කිරීමට නොහැකි විය. | අයවැය ලේඛනය කළමනාකරණ උපකරණයක් ලෙස යොදා ගත යුතුය. |
| (ආ) | අයවැයගත වියදම් හා තත්‍ය වියදම් සැසඳීමේදී වියදම් විෂයයන් 08 ක සියයට 77 ක සිට සියයට 100 ක් අතර පරාසයක විචලනයන් නිරීක්ෂණය විය. | කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් රට තුළ පැවති වාතාවරණය හමුවේ ගොවිජන සංවර්ධන අරමුදලින් 2020 වර්ෂය සඳහා අයවැයගත කාර්යයන් ඒ අයුරින්ම සිදු කිරීමට නොහැකි වූ නිසා අයවැයගත වියදම් හා තත්‍ය වියදම් අතර විචලනයන් ඇති වී තිබුණි. | අයවැය ලේඛනය කළමනාකරණ උපකරණයක් ලෙස යොදා ගත යුතුය. |